EWIS PERIPHERALS
22
12 SEP 2025
RECEIVED

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
**Ministry of Agriculture, Livestock, Lands and Irrigation**

කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / **Agriculture Division**

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ராஜமல்வத்தை வீதி,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Road, Battaramulla, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. | 5/3/1/2/5- X | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2025.09.01 |

කළමනාකරු,
**Ewis Peripherals (Pvt) Ltd**

<u>ටෝනර් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමයි.</u>

01. කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් ටෝනර් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.
02. මුද්‍රා තබන ලද ඔබගේ මිල ගණන් 2025.09.09 දින ප.ව. 2.00 ට පෙර ලේකම්, කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, 80/5 ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.
03. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී <u>"ටෝනර් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම"</u> යන්න කවරයේ වම් පස ඉහල කෙලවරේ සඳහන් කොට එවීමට කටයුතු කළ යුතුය.
04. ඔබගේ මිල ගණන් ඉලක්කමෙන් හා අකුරෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය.
05. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් එම බදු ප්‍රමාණය වෙන ම පෙන්නුම් කළ යුතු අතර, එම බදු සඳහා වූ ලියාපදිංචි අංකය ද සඳහන් කළ යුතු ය.
06. එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වී නොමැති සැපයුම්කරුවන් ඒ සම්බන්ධයෙන් තහවුරුවක් ලබා දිය යුතු අතර එවැනි සැපයුම්කරුවන් එකතු කළ අගය මත වන බදු ඉල්ලීම් පිළිබඳ මෙම අමාත්‍යාංශයට වගකීමක් නොමැත.
07. සැපයුම්කරුවන් විසින් දෙනු ලබන වට්ටම් යනාදිය අඩුකර ශුද්ධ මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය.
08. ඉදිරිපත් කරන මිල ගණන් අවම වශයෙන් දින 30 ක කාලයක් වලංගු විය යුතු ය.
09. මිල ගණන් ඉදිරිපත් කිරීමේදි Original සහ Compatible යන ටෝනර් වර්ග දෙක සඳහා මිල ගණන් සහ ටෝනර් එකකින් ලබාගත හැකි පිටපත් ප්‍රමාණය පැහැදිළිව සඳහන් කළ යුතුය.
10. කිසිම හේතුවක් නොදක්වා මිල ගණන් කැඳවීම ප්‍රතික්ෂේප කිරීමට හෝ කිසියම් කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය අමාත්‍යාංශ ලේකම් සතු වේ.
11. ඔබගේ මිල ගණන් පිළිගතහොත් දින 05 ක් ඇතුළත භාණ්ඩ සපයා අවසන් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් සැපයුම්කරුගේ අසාර්ථකභාවය පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට හා / හෝ ඇණවුම අවලංගු කිරීමට සිදු වේ.
12. භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් පසුව ගෙවීම් කිරීම සඳහා ඔබගේ බිල්පත් ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු ය.
13. ඔබගේ මිල ගණන් මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව ඉදිරිපත් කළ යුතු ය.
14. මුද්දර බදු සඳහා ලියාපදිංචි නොවූ සෑම ආයතනයකින්ම රු 25,000.00 ට වැඩි (වැට් සහිත) ගෙවීම් සඳහා ගෙවිය යුතු මුදලින් රු 25.00 ක් මුද්දර බදු වෙනුවෙන් අය කර ගනු ලැබේ.
15. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර 0112887406 යන දුරකතන අංකය මඟින් ලබා ගත හැක.

දේවිකා හීන්දැලිය
සහකාර ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

| | | | |
|---|---|---|---|
| ලේකම් කාර්යාලය / செயலாளர் அலுவலகம் / Secretary Office | දුරකථන / தொலைபேசி Telephone - 011-2034301 | පොදු / பொது / General | දුරකථන / தொலைபேசி Telephone - 011-2034300 |
| | ඊ-මේල් / மின்னஞ்சல் e- mail - secretary@agrimin.gov.lk | | ඊ-මේල් / மின்னஞ்சல் e- mail - info@agrimin.gov.lk |
| | ෆැක්ස් / தொலைநகல் Fax - 011-2863497 | | ෆැක්ස් / தொலைநகல் Fax - 011-2868910 |